අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව
இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சாத்துதல்களைப் புலனாய்வு செய்வதற்கான ஆணைக்குழு
COMMISSION TO INVESTIGATE ALLEGATIONS OF BRIBERY OR CORRUPTION
තැ. පෙ. 1431, 36, මලලසේකර මාවත, කොළඹ 7. ● த.பெ.1431, 36, மலலசேகர மாவத்தை, கொழும்பு 7.● P. O. Box 1431, 36, Malalasekera Mawatha, Colombo 7.
දුරකථන අංක / தொலைபேசி / Telephone: 2559923, 2596360 ෆැක්ස් / பெக்ஸ் / Fax: 2596014

SC (FR) Application No.209/2007

To : His Lordship the Chief Justice
And the other Judges of the Supreme Court

On this 5th day of December 2008.

**Report of the action taken by the Commission on the basis of the findings in SC (FR) 209/2007**

Pursuant to the findings in the judgment dated 21.07.2008 and in terms the direction of Your Lordships' Court made on 29.09.2008 and 08.10.2008, to ascertain in terms of the applicable law whether any offences have been committed, the Commission, acting in terms of Section 4 (2) of Act, No. 19 of 1994, directed that an investigation be conducted in compliance with the aforesaid directions.

The investigating officer in his report to the Commission has set out the action already taken by the Investigation Division and has indicated the present position in regard to this investigation. His report to the Commission is annexed hereto.

This report is filed in compliance with the order of Your Lordships' Court – SC minutes of 8th October, 2008.

Ameer Ismail
Chairman
Commission to Investigate Allegations of Bribery or Corruption
30th Respondent.

මගේ අංකය - බිසී/950-24/2008/බී 09
බිසී/1702/2008.

2008.12.04.

ස්ථානාධිපතිතුමා/විවෘත විමර්ශන
සහකාර අධ්‍යක්ෂතුමා විමර්ශන;
අධ්‍යක්ෂතුමා විමර්ශන,
අධ්‍යක්ෂ ජනරාල්තුමිය මගින්,
සභාපතිතුමා.

ලංකා මැරයින් සර්විසස් ආයතනය පුද්ගලීකකරණය කිරීම සම්බන්ධ කෝප් වාර්තාව මගින් කරන ලද දැන්වීමට සහ ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක HC(FR)/209/2007 නඩු තීන්දුවේ නියෝගය අනුව කරන ලද විමර්ශන

සභාපතිතුමාගෙන් ලැබුණු නියෝග පරිදි ඉහත සඳහන් විමර්ශනයට අදාලව මෙතෙක් කර ඇති විමර්ශන කටයුතු පිළිබඳව ප්‍රගතිය පහත සඳහන් පරිදි ඉදිරිපත් කරමි.

ලංකා මැරයින් සර්විසස් ආයතනයේ කොටස් 90% ක් පුද්ගලික අංශයට විකිණීමට පරක් ආයතනය විසින් කටයුතු කිරීමේ දී එම මැරයින් සර්විසස් ආයතනය පිහිටි අංක 69 වෝල්ස් පටුමග, කොළඹ 13, රජයට අයත් අක්. 8 රූඩ් 2 පර්.21.44 ක් විශාල බ්ලූමැන්ඩල් පාර පිහිටි ඉඩම පුද්ගලික අංශයට පවරා දීම සම්බන්ධයෙන් රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවේ (කෝප්) නිරීක්ෂණ ඇතුලත් වාර්තාව පාර්ලිමේන්තුව මගින් මෙම කොමිෂන් සභාව වෙත 2007.09.06 වෙනි දින යොමු කර ඇති අතර, මේ සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කිරීම සඳහා කොමිෂන් සභාව විසින් 2007.10.03 වෙනි දින නියෝගයක් ලබාදී ඇත.

මෙම විමර්ශනයේ දි විමර්ශනයට අදාල පහත් සඳහන් ප්‍රකාශ ලබාගෙන ඇත.

(1) ඩබ්.ඩබ්.ජායා තිලිණි මිය - විගණන අධිකාරි විගණන දෙපාර්තමේන්තුව

(2) ජේ.පී.ප්‍රියංගනී ලියනගේ මිය - ජ්‍යෙෂ්ඨ කළමනාකාරිණී රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

(3) පී. ඩී.ඉන්දිකා ලක්මාලි විජේගුණවර්ධන මිය - නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

(4) පී.සරෝජනිද ෆොන්සේකා මිය - නීති අධ්‍යක්ෂ, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

(5) දයාන්ත ඉලරාජ් ද මෙල් මයා - විධායක උප සභාපති, D.F.C.C බැංකුව

(6) එම්.එච්.දිපාල් සුමති ගුණරත්න මයා - හිටපු අධ්‍යක්ෂ, ජනරාල් පර්ක් ආයතනය ( PERC)

(7) එච්.එම්.තිරංජලා ශ්‍යාමලී ගුණවර්ධන මිය - හිටපු නීති අධ්‍යක්ෂ, පර්ක් ආයතනය

(8) දහම් විමලසේන මහතා - හිටපු සභාපති, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

(9) දේශනී අබේගුණවර්ධන මිය - හිටපු අධ්‍යක්ෂිකා, පර්ක් ආයතනය

(10) රුවනි සකුන්තලා විජයනන්දන මිය - හිටපු ජ්‍යෙෂ්ඨ කළමනාකාරිණී පර්ක් ආයතනය.

එසේ විමර්ශන කටයුතු කරගෙන යන අතරතුරදී මෙකී ගණුදෙනුවට අදාළව ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කර ඇති අංක HC(FR)/209/2007 දරන නඩුව සම්බන්ධයෙන් 2008.07.21 වන දින, දී ඇති නඩු තීන්දුව පදනම් කරගෙන සුදුසු පියවර ගන්නා ලෙස අදාළ පාර්ශවයන්ට කරන ලද නියෝගය අනුව මෙම කොමිෂන් සභාවේ නියමය පරිදි ලංකා මැරයින් සර්විසස් ආයතනය පුද්ගලීකරණය කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධව පූර්ණ පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කරන ලදී.

ඒ අනුව ගරු අධිකරණයෙන් දෙන ලද නියෝගය පරිදි මැරයින් සර්විසස් ආයතනයේ කොටස් 90% ක් විකිණීම සම්බන්ධව ද, මැරයින් සර්විසස් ආයතනයට ආයෝජන මණ්ඩල පහසුකම් ලබාදීම සම්බන්ධව ද විමර්ශන කටයුතු කොමිෂන් සභාවෙන් කර ඇති නියමය පරිදි ආරම්භ කර පහත සඳහන් ප්‍රකාශ සටහන් කරන ලදී.

(01) පී.බී.ජයසුන්දර- මහතා හිටපු සභාපති, පර්ක් ආයතනය ( PERC)

(02) දයාරත්න චන්ද්‍රසේකර මයා - හිටපු වැඩ බලන අධ්‍යක්ෂ, ලංකා මැරයින් සර්විසස් ආයතනය සහ තාක්ෂණික ඇගයීම් කමිටුවේ සාමාජික.

(03) සිරිපාල ජයලත් පතිරණ මයා - හිටපු ඉඩම් කොමසාරිස්

(04) ඩබ්.එච්.ඒ.ගාමිණී ජයතිලක මයා - ආයතන කළමනාකරු, ආයෝජන මණ්ඩලය

(05) ආර්.එම්.එම්.එස්.බී.රාජපක්ෂ මයා - අතිරේක ප්‍රධාන තක්සේරුකරු, තක්සේරු දෙපාර්තමේන්තුව

(06) බී.ඩබ්.සේනාරත්න මයා - ප්‍රධාන තක්සේරුකරු, තක්සේරු දෙපාර්තමේන්තුව

(07) කොඩිකාරගේ ධර්මසේන මයා - නියෝජ්‍ය කොමසාරිස්, දේශීය ආදායම් කොමසාරිස්

(08) ඩී.පී.ප්‍රේමරත්න දේවප්‍රිය මයා - ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, ඛනිජ තෙල් හා ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය

(09) එච්.කේ.සෙනෙවිරත්න මයා - නීති උපදේශක, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

(10) එච්.රෝසි ද සිල්වා මයා - හිටපු ප්‍රධාන තක්සේරුකරු, තක්සේරු දෙපාර්තමේන්තුව

(11) ඩබ්.එම්.මංගලිකා රෝහිණී අධිකාරි- අතිරේක ලේකම්, ඛනිජ තෙල් හා ඛනිජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය

(12) බී.සුනිල් ගාමිණී මයා - සමාගම් පරීක්ෂක, සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව

(13) එල්.ඩී.සී.ජයසිංහ මයා - ඛනිජ තෙල් හා ඛනිජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය.

මෙම විමර්ශන කටයුතුවලදී මැරයින් සර්විසස් ආයතනයේ 90% ක කොටස් විකිණීම, එම සමාගම පිහිටි රජයේ ඉඩම පුද්ගලික අංශයට පැවරීමේදී පර්ක් ආයතනය විසින් කටයුතු කිරීම සහ මැරයින් සර්විස් ආයතනයට ආයෝජන මණ්ඩල පහසුකම් ලබාදීම යන කරුණුවලට අදාලව පහත සඳහන් ලේඛන භාරගෙන ඇත.

01) මැරයින් සර්විසස් ආයතනය විසින් පවත්වාගෙන ගිය ඒකාධිකාරි ව්‍යාපාර කටයුතු නිදහස් ව්‍යාපාරික කටයුත්තක් ලෙස පරිවර්තනය කිරිම සඳහාත් එම සමාගමේ කොටස් 90% ක් පුද්ගලික අංශයට විකිණීම සඳහාත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනිම සම්බන්ධ අමාත්‍ය මණ්ඩල සංදේශවල සහ අමාත්‍ය මණ්ඩල තිරණවල සහතික පිටපත්.

02) මෙම සමාගමේ කොටස් විකිණීමට පර්ක් ආයතනය විසින් කටයුතු කිරිම සම්බන්ධ ලිපිගොනු ද.

03) මැරයින් සර්විසස් ආයතනයේ කොටස් 90% ක් විකිණීම සම්බන්ධවත් ඉඩම පැවරිම සම්බන්ධවත් අත්සන් කර ඇති ගිවිසුම්.

04) මැරයින් සර්විසස් ආයතනයේ කොටස් විකිණීම සම්බන්ධව විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයෙන් කටයුතු කිරිම පිළිබඳව ලිපිගොනුව.

05) මැරයින් සර්විසස් ආයතනය සමාගමක් ලෙස ලියාපදිංචි කිරිමට අදාළ ලේඛන.

06) මැරයින් සර්විසස් ආයතනය විකිණීමට පෙර සහ පසුව සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවට සහ දේශිය ආදායම් කොමසාරිස් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇති ආදායම් වාර්තා.

07) මැරයින් සර්විසස් සමාගමට ආයෝජන මණ්ඩල පහසුකම් ලබාදීම පිළිබඳ ලේඛන.

ඉදිරි විමර්ශන කටයුතු සඳහා පහත සඳහන් පාර්ශවයන්ගෙන් ප්‍රකාශ ලබා ගත යුතුව ඇත.

01. ලංකා මැරයින් සර්විසස් ආයතනයෙන් කොටස් 90% ක් විකිණීමට පර්ක් ආයතනය කටයුතු කිරිමේ දී එම ආයතනයේ අධ්‍යක්ෂවරුන් වශයෙන් කටයුතු කළ නිලධාරින් ඊට අදාළව කටයුතු කළ ආකාරය පිළිබඳ එක් එක් අධ්‍යක්ෂවරුන්ගෙන් වෙන වෙනම ප්‍රකාශ සටහන් කර ගැනීම.

02. මැරයින් සර්විසස් ආයතනයේ කොටස් 90% ක් විකිණීම සම්බන්ධව කටයුතු කිරිමේදී තාක්ෂණික ඇගයීම් කමිටුවේ සාමාජිකයෙකු ලෙස කටයුතු කළ ඒ.ඩබ්.සී.පෙරේරා මහතාගේ ප්‍රකාශය.

03. ජෝන් කීල්ස් ආයතනයේ අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කරන සුසන්ත රත්නායක මහතාගේ ප්‍රකාශය.

04. මැරයින් සර්විසද් ආයතනයට ආයෝජන මණ්ඩල පහසුකම් ලබාදීම සම්බන්ධයෙන් අනුමැතිය ලබාදුන් අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින්ගේ ස්වාධීන ප්‍රකාශයන්.

05. ටයිටස් ජයවර්ධන මහතා - විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ හිටපු අධ්‍යක්ෂ.

06. අර්ජුන මහේන්ද්‍ර මහතා - ආයෝජන මණ්ඩලයේ හිටපු අධ්‍යක්ෂ ජනරාල්

07. කුලසේකර මහතා - නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, ආයෝජන මණ්ඩලය

මෙම මැරයින් සර්විසස් ආයතනයේ කොටස් විකිණීමට කටයුතු කර ඇති පර්ක් ආයතනය දැනට වසා ඇති බැවින් අදාළ ලේඛන හා තොරතුරු ලබා ගැනීමේ ඇති අපහසුතාවය නිසාත් එම ආයතනයේ සේවය කල කාර්ය මණ්ඩලය විවිධ ආයතනවලට අනුයුක්ත කර ඇති නිසාත් සමහර නිලධාරින් විශ්‍රාම ගොස් ඇති නිසාත් අදාළ නිලධාරින් සම්බන්ධ කර ගැනීම අපහසුතා ඇති බැවින් ද මෙම මැරයින් සර්විසස් ආයතනය නිදහස් ව්‍යාපාරය ආයතනයක් බවට පත් කිරීමට අමාත්‍ය මණ්ඩල සංදේශය 2000 වර්ෂයේ දී වරාය හා නාවික සංවර්ධන අමාත්‍යාංශයෙන් ද 2001 වර්ෂයේ දී මුදල් අමාත්‍යාංශයෙන් ද 90% කොටස් විකිණීම සම්බන්ධ අමාත්‍ය මණ්ඩල සංදේශය 2002 වර්ෂයේ දී විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය මගින් ද ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇති බැවින් ඒ ඒ අමාත්‍යාංශවලින් අදාළ තොරතුරු හා ලේඛන ලබා ගැනීමට ඇති අපහසුතාවය නිසාත් විමර්ශන කටයුතු කඩිනමින් කරගෙන යාමට බාධාවක් වී ඇති බව ද කාරුණිකව වාර්තා කරමි.

2008/12/04

පොලිස් පරීක්ෂක ටී.එම්. සෙනවිරත්න,
විමර්ශන නිලධාරි (බී 09).